

ශ්‍රී ලංකා නාවික හමුදාව

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2022

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ශ්‍රී ලංකා නාවික හමුදාව

වැය ශීර්ෂය 223

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ඉන්දියන් සාගරයේ මුහුදු මාර්ගයට මැදිව පිහිටා ඇති ශ්‍රී ලංකාව අතීතයේ සිටම නාවිකයින්ගේ නිබඳ අවධානයට යොමු වූ දිවයිනක් විය. ඒ අනුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් විසින් කාලයෙන් කාලයට අප දිවයින ඔවුන්ගේ පාලනයට නතු කරගන්නා ලදී. සියවසකට අධික කාලයක් ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයින් විසින් නාවික හමුදාවක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 1937 වර්ෂයේ දී ලංකා නාවික ස්වේච්ඡා බලකාය (Ceylon Naval Volunteer Force) ආරම්භ කරන ලදී. දෙවන ලෝක යුද්ධය අවසානයත් සමඟම රාජකීය නාවික හමුදාව විසින් ලංකා නාවික ස්වේච්ඡා බලකාය බ්‍රිතාන්‍ය නාවික හමුදාව යටතට පවරාගන්නා ලද අතර, එතැන් පටන් එය ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උපසේවය (Ceylon Royal Naval Volunteer Reserve) ලෙස හඳුන්වා දෙන ලදී. 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් නිදහස ලබා ගැනීමත් සමඟින් ශ්‍රී ලංකාවට ස්ථිර නාවික හමුදාවක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව 1950 දෙසැම්බර් 09 වන දින අංක 34 දරන නාවික පනත නීතිගත කළ අතර, එමඟින් ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) පිහිටුවන ලදී. 1972 වර්ෂයේදී හඳුන්වා දුන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟම ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) යන නම ඉවත් කර, ඒ වෙනුවට ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy) ලෙස නාමය වෙනස් කරන ලදී. මෙවන් ඉතිහාසයකට හිමිකම් ලබන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් වූ මුහුදේ පවා රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් සිදු කරමින්, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා තම උපරිම දායකත්වය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලබා දෙනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

ශ්‍රී ලංකා නාවික හමුදාව රටේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ මෙන්ම ගොඩබිමේ දී ක්‍රියාත්මක බලවේගයකි. මෙහෙයුම් අවශ්‍යතා සහ වෙනත් හදිසි අවස්ථාවල දී නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් හමුදාවන්ට සහ පොලීසියට සහාය ලබා දීමේ අවශ්‍යතාවය හේතුවෙන් මෑත අතීතයේ දී නාවික හමුදාවට ගොඩබිම්වල මෙහෙයුම් හැකියාව ද විශාල ලෙස වැඩිදියුණු විය.

1.2.1 දැක්ම

ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්ෂා කරමින් එහි ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහි ද අභියෝගයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.

1.2.2 මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි, උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින්, සාගරික සම්පත් ආරක්ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැකගත හැකි නාවික හමුදාවක් බවට පත් වීම.

1.2.3 අරමුණු

අ. නාවික කටයුතු

(1) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව සුරක්ෂිත කිරීම තුළින් ස්වෛරී සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.
(2) අවි ජාවාරම සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම.
(3) නීති විරෝධී සංක්‍රමණිකයින් වැළැක්වීම/ රට තුළට සංක්‍රමණය වීම වැළැක්වීම.
(4) නීති විරෝධී ජාවාරම් වැළැක්වීම.
(5) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ මුහුදු තීරය භාවිත කිරීම වැළැක්වීම.
(6) ශ්‍රී ලංකා මුහුදේ අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම.
(7) මසුන් ඇල්ලීම සහ අනවසර මූලද්‍රව්‍ය මඟින් සමුද්‍ර සම්පත් ගවේෂණය කිරීම හා සූරාකෑම වැළැක්වීම සඳහා අධීක්ෂණය.
(8) ත්‍රස්තවාදී ප්‍රහාර, කඩාකප්පල්කාරී ප්‍රහාර, මුහුදු කොල්ලකෑම්වලට එරෙහිව සියලු වරායන් සඳහා ආරක්ෂාව සැපයීම.

(9) යුධමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම සහ ස්වකීය හමුදාවන්ට ආධාර කිරීම සඳහා නාවික සහාය ලබා දීම.
(10) මුහුදු සන්නිවේදන මාර්ග පවත්වා ගෙන යන අතර, අවශ්‍ය විටෙක ආරක්ෂක අංශ සඳහා සැපයුම් සහය සහ මුහුදු ගමන් සැපයීම.
(11) මුහුදේ නිරීක්ෂණ කටයුතු සහ මුදාගැනීමේ (SAR) මෙහෙයුම් සිදු කිරීම.
(12) කිමිදුම් සහ ගැලවීමේ මෙහෙයුම් සිදු කිරීම.
(13) නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම.
(14) භූමි මෙහෙයුම් සහ භූමි ආරක්ෂාව.
(15) නාවික හටයින් පුහුණු කිරීම.

ආ. **<u>නාවික නොවන ක්‍රියාකාරකම්</u>**

(1) සිවිල් බලයට ආධාර කිරීම සහ ස්වාභාවික විපත්වලදී ආධාර සැපයීම.
(2) සමුද්‍රීය කුසලතා රජයට සහ වෙනත් සංවිධානවලට ලබා දීම.
(3) නාවික නොවන පුද්ගලයින් පුහුණු කිරීම.
(4) සම්භාවනීය අමුත්තන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට මුහුදු ගමන් මාර්ගය සැපයීම.
(5) රජයේ සහ පෞද්ගලික සංවිධානවලට කිමිදුම් සහ ගැලවීමේ ආධාර ලබා දීම.
(6) ශ්‍රී ලංකා රේගුවට සහාය වීම.
(7) විද්‍යාත්මක හා සාගර දත්ත රැස් කිරීම.

1.3 **<u>ප්‍රධාන කාර්යයන්</u>**

අ. ආරක්ෂක සේනාවන්හී එක් විශේෂ යුධ සේනාංකයක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව නම් කළ හැක. මෙහි ප්‍රාථමික කාර්යභාරය වනුයේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රතිපත්තීන්ට අනුව රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා ඊට එරෙහිව හට ගන්නා මොනයම් හෝ තර්ජනයන්ගෙන් රට ආරක්ෂා කිරීමත් ගැඹුරු මුහුදේ, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා දායක වීමත්ය. නාවික හමුදාව මඟින් ආරක්ෂා කරන කලාපයන් වශයෙන් මුහුදුකරය, දේශීය ජලතීරය, යාබද කලාප සහ විශේෂිත ආර්ථික කලාපයන් නම් කර ඇති අතර, ඒ ඒ කලාපයන්ට අදාළව පවරා ඇති රාජකාරීන් සාමකාමී හා ගැටුම්කාරී වාතාවරණයන් තුළ එක ලෙස ඉටු කිරීමට නාවික හමුදාව බැඳී සිටියි.

ආ. තවද, විශේෂයෙන් ඇතිවිය හැකි අභ්‍යන්තර ගැටුම් වැනි ගැටලුකාරී අවස්ථාවන්හිදී අනෙකුත් ආරක්ෂක සේවා සමඟ එක්වී ගොඩබිම් මෙහෙයුම් දියත්කර රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කර්තව්‍යන්හී නිරත වීම ද්විතියික කාර්යය ලෙස හැඳින් වේ.

ඇ. තවද, රාජ්‍ය ආයතනයන්හී පරිපාලන කටයුතු සඳහා සහාය වීම, විශේෂයෙන්ම සංවර්ධන වැඩපිළිවෙල උදෙසා සමුද්‍රීය ක්‍රියාකාරකම්වල යෙදී සිටින ආයතන සඳහා සහයෝගය ලබා දීම හා වෙරළ හා සමුද්‍රීය ආරක්ෂණය නාවික හමුදාවේ තෘතීය කාර්යය ලෙස හැඳින්විය හැක.

නාවික හමුදා සංවිධාන සටහන



1.5 රටට අයත් මුහුදු තීරය ඵලදායි ලෙස පරිපාලනය සහ ආරක්ෂා කිරීමත් පැවරෙන රාජකාරීන් කාර්යක්ෂමව ඉටුකිරීමත් සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන අයුරින් පහත සඳහන් පරිදි නාවික විධාන 07කට බෙදා වෙන් කර පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

අ.	බටහිර නාවික විධානය	-	ආඥාපති බටහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ආ.	නැගෙනහිර නාවික විධානය	-	ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඇ.	උතුරු නාවික විධානය	-	ආඥාපති උතුරු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඈ.	උතුරු මැද නාවික විධානය	-	ආඥාපති උතුරු මැද නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඉ.	දකුණු නාවික විධානය	-	ආඥාපති දකුණු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඊ.	වයඹ නාවික විධානය	-	ආඥාපති වයඹ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
උ.	ගිණිකොණ නාවික විධානය	-	ආඥාපති ගිණිකොණ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි

1.6 ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇති ඒ ඒ නාවික විධානයන්ට අයත් ගොඩබිම් ආයතන පහත පරිදි වේ.

අ.	බටහිර නාවික විධානය	ශ්‍රීලංනානෞ ලංකා ශ්‍රීලංනානෞ ගැමුණු ශ්‍රීලංනානෞ මහසෙන් ශ්‍රීලංනානෞ රංගල ශ්‍රීලංනානෞ තක්ෂිලා ශ්‍රීලංනානෞ පරාක්‍රම නාවික මහ රෝහල (කොළඹ) ශ්‍රීලංනානෞ ශිල්ප ශ්‍රීලංනානෞ කැළණි නාවික ස්ථානගත කිරීම අකුරේගොඩ
ආ.	නැගෙනහිර නාවික විධානය	නාවික හා සාගරික විද්‍යාපීඨය ශ්‍රීලංනානෞ විදුර 4 වන වේග ප්‍රහාරක යාත්‍රා සමූහය ශ්‍රීලංනා තටාකාංගණය ශ්‍රීලංනානෞ විජයබා ශ්‍රීලංනානෞ කාශ්‍යප ශ්‍රීලංනානෞ රන්වැලි ශ්‍රීලංනානෞ තිස්ස ශ්‍රීලංනානෞ මහවැලි ශ්‍රීලංනානෞ පැරකුම්බා ශ්‍රීලංනානෞ ගෝඨාභය විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානය ශ්‍රීලංනානෞ ගෝකණ්ණ ශ්‍රීලංනානෞ වළගම්බා ශ්‍රීලංනානෞ ලංකාපටුන

ඇ.	උතුරු නාවික විධානය	ශ්‍රීලංනානෞ වේළුසුමන ශ්‍රීලංනානෞ කංචදේව ශ්‍රීලංනානෞ උත්තර ශ්‍රීලංනානෞ එළාර ශ්‍රීලංනානෞ අග්බෝ ශ්‍රීලංනානෞ වසභ ශ්‍රීලංනානෞ ගෝඨයිම්බර නාවික ස්ථානගත කිරීම වෙත්තලකේණි
ඈ.	උතුරු මැද නාවික විධානය	ශ්‍රීලංනානෞ ශික්ෂා ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ශ්‍රීලංනානෞ තම්මැන්නා ශ්‍රීලංනානෞ ගජබා ශ්‍රීලංනානෞ ඵුස්සදේව ශ්‍රීලංනානෞ බුවනෙක
ඉ.	දකුණු නාවික විධානය	ශ්‍රීලංනානෞ දක්ෂිණ ශ්‍රීලංනානෞ නිපුණ ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ශ්‍රීලංනානෞ රුහුණ
ඊ.	වයඹ නාවික විධානය	ශ්‍රීලංනානෞ විජය ශ්‍රීලංනානෞ තම්බපණ්නි ශ්‍රීලංනානෞ හරණ ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණ මූලස්ථානය ශ්‍රීලංනානෞ ථේරපුත්ත නාවික ස්ථානගත කිරීම මහව
උ.	ගිණිකොන නාවික විධානය	ශ්‍රීලංනානෞ මහානාග ශ්‍රීලංනානෞ දිසායු

ඌ. ශ්‍රී ලංකා නාවික හමුදාව තුළ ඇති නෞකා සහ යාත්‍රාවන්

(1)	අක්වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා	-	08
(2)	වේග මිසයිල ප්‍රහාරක නෞකා	-	02
(3)	වේග ප්‍රහාරක නෞකා	-	09
(4)	වෙරළාරක්ෂක මුර යාත්‍රා	-	02
(5)	වේග ප්‍රහාරක මුර යාත්‍රා	-	48
(6)	වේග මගී ප්‍රවාහන යාත්‍රා	-	03
(7)	ගොඩ බිමට යාහැකි භාණ්ඩ ප්‍රවාහන නෞකා	-	01
(8)	ගොඩ බිමට යාහැකි මධ්‍යම ප්‍රමාණයේ යාත්‍රා	-	02
(9)	ගොඩ බිමට යාමට උපයෝගි කර ගන්නා යාත්‍රා	-	03
(10)	වේගයෙන් ගොඩ බිමට යාහැකි යාත්‍රා	-	02
(11)	සහයක යත්‍රා	-	01
(12)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා	-	06
(13)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා (වෙරළ ආරක්ෂක)	-	73
(14)	වෙරළාසන්න මුර යාත්‍රා	-	34
(15)	කළපු ආශ්‍රිත මගී ප්‍රවාහන යාත්‍රා	-	20
(16)	ටග් යාත්‍රා	-	04
(17)	ඇරෝ යාත්‍රා	-	161
(18)	ට්‍රොලර් සහ වල්ලම්	-	29
(19)	ලයින් බෝට්	-	01
(20)	ඩිංගි යාත්‍රා	-	320

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු.

ඉන්දියානු රජය මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තටාකාංගනයක් ප්‍රධානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇති අතර, එම පාවෙන තටාකාංගනය 2025 වසර තුළ දී ශ්‍රී ලංකාව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2022 වර්ෂයට ආදාළ ප්‍රගතිය

2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

අ. 2022 වර්ෂය තුළදී නිලධාරීන් 04ක් සහ නාවිකයින් 59ක් අලුතින් බුද්ධි අංශය සඳහා බඳවා ගැනීම.

ආ. නාවික හමුදා බුද්ධි අංශය සඳහා තොරතුරු එක්රැස් කිරීම, තොරතුරුකරුවන් නඩත්තු කිරීම සහ අනෙකුත් බුද්ධි රාජකාරීන් සඳහා රුපියල් 10,060,000.00 ක මුදලක් 2022 වර්ෂය තුළ දී වියදම් කර ඇත.

2.1.2 නාවික හමුදා පුද්ගලයින්හට වැටුප් හා දිමනා ගෙවීම



මූලික වැටුප - නිත්‍ය	රු.16,306,931,116.00
මූලික වැටුප -ස්වේච්ඡා	රු.4,877,422,222.50
අනෙකුත් දීමනා - නිත්‍ය	රු.14,868,279,256.89
අනෙකුත් දීමනා - ස්වේච්ඡා	රු.4,772,190,047.48
එකතුව	රු.47,901,135,114.51

සටහන : අනෙකුත් දීමනා අගය දැක්වීමේ දී 2022 දෙසැම්බර් මස නැව් 327 දීමනාවට අදාළ වටිනාකම (නිත්‍ය/ ස්වේච්ඡා) 2023 ජනවාරි මස වේතනය සකස් කිරීමට පෙර ලබා දීමට නොහැකි බැවින් මාස 11ක පමණක් වටිනාකම දක්වා ඇත.

2.1.3 නාවික හමුදා පුද්ගලයින් හට උපස්ථීම් ලබා දීම

නිලධාරීන්

අනු අංකය	උපස් කරන ලද නිලය	උපස් කරන ලද ගණන
1	අද්මිරාල්	01
2	වයිස් අද්මිරාල්	01
3	රියර් අද්මිරාල්	13
4	කොමදෝරු	21
5	කපිතාන්	39
6	කොමාණ්ඩර්	89
7	ලුතිනන් කොමාණ්ඩර්	144
8	ලුතිනන්	140
9	උප ලුතිනන්	141
10	වැඩ බලන උප ලුතිනන්	109
11	මධ්‍ය නිලධාරි	187
එකතුව		885

නාවිකයින්

අනු අංකය	උපස් කරන ලද තරාතිරම	උපස් කරන ලද ගණන
1	පාලක ප්‍රධාන සුළු නිලධාරි	282
2	සමූහ ප්‍රධාන සුළු නිලධාරි	594
3	ප්‍රධාන සුළු නිලධාරි	997
4	සුළු නිලධාරි	2586
5	නායක නැවි	1917
6	බල නැවි	890
7	සාමාන්‍ය නැවි	1519
එකතුව		8785

2.1.4 **නාවික හමුදා පුද්ගලයින් හට පදක්කම් පිරිනැමීම**

අනු අංකය	පදක්කම	නාවික පුද්ගලයින් ගණන
1	නාවික හමුදාධිපතිගේ ප්‍රශංසාත්මක පළඳනාව	186
2	විදේශ සේවා පදක්කම	02
3	ක්ෂණික විහිදුම් බලකා පළඳනාව	11
4	දේශ පුත්‍ර සම්මානය	01
5	පූර්ණ භූමි පදක්කම	488
6	උතුරු නැගෙනහිර මානුෂිය මෙහෙයුම් පදක්කම සහ සන්දාරය	1396
7	ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම සහ සන්දාරය	5248
8	හතරවන වේග ප්‍රහාරක පළඳනාව	656
9	නාවික බුද්ධි පළඳනාව	29
10	උත්තම සේවා පදක්කම	428
11	ප්‍රශංසනීය සේවා විභූෂණය සහ පදක්කම	95
12	UN පදක්කම	01
13	මුහුදු සංග්‍රාමික පළඳනාව	800
14	පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ලබා දෙන්නාවූ පළඳනාව	128

2.1.5 **නාවික හමුදා පුද්ගලයින් පුහුණු හා පාඨමාලා ලබා දීම**

පාඨමාලා වර්ග	පුහුණුව ලැබූ ප්‍රමාණය	
	නිලධාරීන්	නාවිකයන්
අභ්‍යන්තර	358	7378
බාහිර (දේශීය)	891	1914
විදේශීය	210	102
විභාග	370	6400
ශ්‍රේණිගත වැටුප් සකස් කර ගැනීම	-	530

2.1.6 **නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනයට අදාළ කටයුතු ඉටු කිරීම**

අ. නාවික හමුදාවේ රාජකාරි සිදු කරනු ලබන නිලධාරීන් සහ නාවිකයින්ගේ මූල්‍ය පරිත්‍යාග වලින් රු. 12,000.00 ක වටිනාකමකින් යුත් ප්‍රේෂණපත් සහ නාවික බිත්ති දින දර්ශනයක් 1308 ක් සුභ පැතීමේ ත්‍යාග වශයෙන් රණවිරු වැන්දඹුව හෝ ළඟම ඥාතීන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින් හට ලබා දීමට කටයුතු කරන ලදී.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මිය ගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යකදී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු.100,000.00 ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2022 වර්ෂය සඳහා මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 72 දෙනෙකුගේ ළඟම ඥාතීන් හට රු 7,200,000.00ක සම්පූර්ණ මුදලක් අවමංගල්‍යාධාර ලෙස ලබා දී ඇත.

ඇ. සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරීන් හා නාවිකයින් 26 දෙනෙකු වෙනුවෙන් 2022 වර්ෂය තුළ දී මරණ පරිත්‍යාග වශයෙන් රු. 38,103,251.00 ක මුදලක් ලබා දෙන ලදි.

ඈ. 2022 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආබාධිත රණවිරු ගමන් බලපත්‍ර 47 ක් සහ දුම්රිය බලපත්‍ර 40 ක් නොමිලේ ලබා දෙන ලදී.

ඉ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ක්‍රියාන්විතයේදී දිවි පිදූ, ආබාධිත වූ හා අතුරුදන් වූ නාවික පුද්ගලයින් වෙනුවෙන් ‘මෙත් සෙවණ’ නිවාස ව්‍යාපෘතිය සහ සේවයේ නියුතු හා විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙනුවෙන් ‘අපි වෙනුවෙන් අපි’ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පූර්ණ නිවාස 07ක් ද, අර්ධ නිවාස 74ක් ද, ආරක්ෂක ලේකම්තුමාගේ විශේෂ අනුමැතිය මත ‘අපි වෙනුවෙන් අපි’ අර්ධ නිවාස 02ක් ද වර්තමානය වන විට ඉදිකිරීම් සිදු කරමින් පවති.

ඊ. නැවිරු සවිය (නාවික සුවසහන) අරමුදල මගින් 2022 ජනවාරි මස 01 සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා නාවික හමුදා සාමාජිකයන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ සහ සැත්කම් වෙනුවෙන් රු. 153,385,186.97ක මුදලක් ලබා දී ඇත.

2.1.7 **<u>මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම</u>**

අ. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මුහුදු තීරයේ නිරීක්ෂණය වූ ඉන්දීය අනවසර ධීවර යාත්‍රා සංඛ්‍යාව 3404ක් වේ. ඒ අතරින් යාත්‍රා 191 ක් හඳුනාගෙන ඇති අතර, එම යාත්‍රාවන් ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් එළවා දැමීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලදී.

ආ. 2022 වසරේ ශ්‍රී ලංකා මුහුදු සීමාවේ මසුන් අල්ලමින් සිටියදී අත්අඩංගුවට ගත් ඉන්දීය ධීවර යාත්‍රා සංඛ්‍යාව 36ක් වන අතර පුද්ගලයින් 264 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

2.1.8 **<u>අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව හා සාම සාධක රාජකාරී</u>**

2022 වර්ෂයේදී අන්තර් ජාතික පුහුණු වැඩසටහන් 04ක් සඳහා සහභාගි වී ඇත.

2.1.9 **<u>මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග</u>**

අ. නෞකා මුර සංචාරයන් වැඩි කිරීම හා ශ්‍රී ලංකාවට ඇත මුහුදේදී පවා මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන දේශීය/ විදේශීය යාත්‍රා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම සහ 2022 වසර තුළදි පහත සඳහන් පරිදි මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන ඇත.

(1)	හෙරොයින්	- කි.ග්‍රෑ. 1363.5
(2)	අයිස්	- කි.ග්‍රෑ. 148.14
(3)	කේරළ ගංජා	- කි.ග්‍රෑ. 5731.15
(4)	දේශීය ගංජා	- කි.ග්‍රෑ. 25.28/ පැළ 41685
(5)	හෂීස්	- කි.ග්‍රෑ. 1.10
(6)	කුෂ්	- කි.ග්‍රෑ. 0.000300
(7)	මෝදක	- ගණනින් 1725
(8)	මත්පෙති	- ගණනින් 665033
(9)	ගෝඩා	- ලීටර් 210
(10)	කසිප්පු	- ලීටර් 162.50
(11)	අබිං	- ග්‍රෑම් 12
(12)	මත් මුද්දර	- ගණනින් 32

2.1.10 **<u>ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුභසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහය දැක්වීම</u>**

අ. සොරවූ අලුත්වැඩියා, පාලම් පිරිසිදු කිරීම්, මෘත දේහ සෙවීම් සඳහා හා විශේෂ කිමිදුම් රාජකාරි ගණනින් අවස්ථාවන් 212ක් සඳහා දායකත්වය ලබා දී ඇත.

ආ. 2022 වසර තුළ දී කඩොලාන පැළ 16087 ක් සිටුවන ලදී.

ඇ. 2022 වසර තුළ දී තහනම් දැල්, ක්‍රම හා කොන්දේසි උල්ලංඝණය කිරීම් හේතුවෙන් අත්අඩංගුවට ගත් යාත්‍රා සංඛ්‍යාව 140 කි.

ඈ. 2022 වසරේදී නීති විරෝධීව ආනයනය කරන ලද එනසාල් කිග්‍රෑ 192ක්, කහ කිග්‍රෑ 2087ක්, බීඩි කොළ කිග්‍රෑ 17315ක්, කෘමි නාශක බෝතල් 15664ක්/ පැකට් 20755ක් සහ දුම්වැටි ගණනින් 54900ක් අත්අඩංගුවට ගෙන ඇත.

2.1.11 <u>නාවික හමුදාව මඟින් බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>

අනු අංකය	විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි)	2022 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	2022 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	2022 වර්ෂය තුළ සිදු කරන ලද මුලු ව්‍යාපෘති ගණන
1	ආගමික ස්ථාන	1,771.47	39	77	116
2	ආගමික නොවන ස්ථාන	8,456.93	30	49	79

2.1.12 <u>ආරක්ෂක හමුදාවල ශක්තින් ජාතික සංවර්ධනයට දායක කර ගැනීම</u>

2022 වර්ෂය තුළ නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් සිදු කරන ලද ප්‍රති ආශ්‍රැතිකරණ යන්ත්‍ර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		නාවික සමාජයීය මෙහෙවර අරමුදලේ ප්‍රතිපාදන භාවිත කරමින් සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
15	1	38	5	6	-	59	6

අ. රජයේ ආයතන මඟින් ප්‍රතිපාදන සැපයීමෙන් අනතුරුව සඳහිරු සෑය, ගාලු මුවදොර පිටිය, ජාතික කලා භවන යන ස්ථානයන්හී උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කරනු ලබයි.

ආ. නාවික හමුදා කෘෂි ව්‍යාපෘති අරමුදල මඟින් සිදු කර ඇති කාර්යයන්.

(1) අක්කර 26ක භූමි ප්‍රමාණයක දේශීය සහ දෙමුහුම් වී වගාව සිදු කර වී ක්‍රි.ග්‍රෑ 53704.00ක අස්වැන්නක් ලබා ගැනීමෙන් අනතුරුව එය නාවික පුද්ගලයින් අතර සහන මිලට අලෙවිකරන ලදි.

(2) අක්කර 32ක භූමි ප්‍රමාණයක එළවළු සහ පළතුරු වගා කර ක්‍රි.ග්‍රෑ 33504.64ක අස්වැන්නක් ලබා ගැනීමෙන් අනතුරුව එය නාවික පුද්ගලයින් අතර සහන මිලට අලෙවිකරන ලදි.

(3) අක්කර 107ක භූමි ප්‍රමාණයක පොල් වගාව සිදු කර ඇති අතර දැනට පවතින වගාවෙන් ගෙඩි 2052ක අස්වැන්නක් ලබා ගෙන ඇත.

(4) අක්කර 16ක භූමි ප්‍රමාණයක කජු වගා කටයුතු ආරම්භකර ඇති අතර, එය වර්ධනය වෙමින් පවතී.

(5) මාවතගම කෘෂි ව්‍යාපෘතිය සඳහා 2022 අගෝස්තු මස 01 වන දින අක්කර 88ක භූමි ප්‍රමාණයක් සහිත ඩෙනවර්වත්ත නාවික හමුදාවට බදු පදනම යටතේ පවරා ගෙන කිරි ගවයන් දෙදෙනකුගෙන් කිරිගව පාලනය ආරම්භ කර ඇති අතර, දැනට පවතින පොල් වගාවෙන් ගෙඩි 20000 පමණ අස්වැන්නක් ලබා ගෙන ඇත.

2.1.13 <u>නාවික හමුදාව තුළ සිදු කරන ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති</u>

අනු අංකය	ව්‍යාපෘතියේ නම	සිදු කරන ලද නාවික ප්‍රදේශය සහ ස්ථානය	ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය	ව්‍යාපෘතිය අවසන් කරන දිනය	අරමුදල ලබා දීම සම්බන්ධ විස්තර		අවසන් කර ඇති වැඩ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (2022 දෙසැම්බර් මස 31 වන දිනට)
					ඇස්තමේන්තු ගත මුදල (රු)	2022 දෙසැම්බර් මස 31 වන දිනට වියදම් කර ඇති මුදල (රු)	
1	ත්‍රිකුණාමලය නාවික තටාකංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නැගෙනහිර නාවික පෙදෙස	24.03.2015	25.06.2023	4,611,360,000.00	1,989,150,000.00	39.90%
2	ත්‍රිකුණාමළය නාවික තටාකංගනයෙහි දසමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	01.12.2015	30.12.2023	450,000,000.00	264,560,000.00	91.25%
3	නාවික හා සාගරික විද්‍යාපීඨයේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු (නිලධාරි පුහුණු කිරීමේ සංචිතය)	නැගෙනහිර නාවික පෙදෙස	20.02.2019	30.06.2024	390,800,000.00	313,070,000.00	69.0%
4	විශේෂ යාත්‍රා බලඝන මූලස්ථානයේ සිව් මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	24.07.2019	20.12.2023	230,000,000.00	113,390,000.00	66.0%
5	ශ්‍රීලංනානෞ වලගම්බා ආයතනයේ නීරෝධායන මධ්‍යස්ථානයක් (අංක 01) ඉදිකිරීම (අදියර 1)	නැගෙනහිර නාවික පෙදෙස	18.12.2021	20.12.2023	52,400,000.00	31,830,000.00	36.0%
6	නාවික තටාකාංගණයේ පෞරාණික ගොඩනැගිලි නැවත සකස් කිරීම	නැගෙනහිර නාවික පෙදෙස	10.12.2016	31.12.2024	55,430,000.00	41,680,000.00	82.5%
7	වැලිසර නාවික කඳවුරේ ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරි විවාහක නිවාස ඉදිකිරීම - I අදියර	බටහිර නාවික පෙදෙස	01.09.2016	25.02.2022	137,500,000.00	128,790,000.00	100%
8	ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වේ පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම	බටහිර නාවික පෙදෙස	04.08.2021	31.12.2024	218,000,000.00	48,090,000.00	21.80%
9	ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදි කිරීම	බටහිර නාවික පෙදෙස	25.04.2021	28.02.2023	1079,000,000.00	952,964,000.00	73.0%

10	ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සයමහල් කණිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම	දකුණු නාවික පෙදෙස	01.04.2019	30.04.2023	140,000,000.00	122,230,000.00	82.34%
11	හම්බන්තොට නාවික හමුදා කඳවුරේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම (පස් මහල් කණිෂ්ඨ නාවික නිවාසය)	දකුණු නාවික පෙදෙස	03.06.2017	30.12.2023	390,000,000.00	183,080,000.00	36.80%
12	ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	15.05.2015	25.12.2024	450,000,000.00	211,290,000.00	63.32%
13	ශ්‍රීලංනානෞ එළාර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	13.05.2019	25.12.2023	60,000,000.00	55,390,000.00	79.0%
14	උතුරු නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි 79ක් ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	11.11.2016	25.12.2023	45,000,000.00	29,470,000.00	65.0%
15	ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන මෙහෙයුම් මැදිරිය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	09.01.2022	25.12.2023	35,000,000.00	18,840,000.00	35.0%
16	ශ්‍රීලංනානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය	උතුරු මැද නාවික පෙදෙස	03.02.2017	31.12.2024	369,190,000.00	231,550,000.00	58.85%
17	ශ්‍රීලංනානෞ ශික්ෂා ආයතනයේ තෙමහල් ශාස්ත්‍රාලය ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	16.02.2015	07.10.2022	150,000,000.00	120,950,000.00	100.0%
18	උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	03.05.2017	30.12.2025	55,460,000.00	41,510,000.00	53.35%
19	ශ්‍රීලංනානෞ ශික්ෂා ආයතනයේ මුලුතැන්ගෙය, පොදු භෝජනාගාරය, ආහාරපාන ගබඩාව, නාවික ගබඩාව සහ බේකරි සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	10.02.2019	05.03.2022	40,000,000.00	32,540,000.00	100.0%

20	ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ආයතනයේ පණ්ඩුකාභයෙහි කනිෂ්ඨ නාවිකයින්ගේ නවාතැන් පහසුකම් සඳහා සිවිමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	10.02.2019	05.03.2022	35,000,000.00	30,930,000.00	100.0%
21	ශ්‍රී ලංකා නාවික නෞකා මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	ගිණිකොන නාවික පෙදෙස	21.08.2019	30.12.2023	48,700,000.00	29,540,000.00	71.58%
22	ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	වයඹ නාවික පෙදෙස	06.07.2019	30.12.2023	250,000,000.00	116,230,000.00	41.50%

<u>ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය</u>





<u>ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයෙහි දස මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම</u>





නාවික හා සාගරික විද්‍යාපීඨයේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු (නිලධාරි පුහුණු කිරීමේ සංචිතය)





විශේෂ යාත්‍රා බලඝන මූලස්ථානයේ සිවි මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම





ශ්‍රීලංකාවේ වළගම්බා ආයතනයේ නීරෝධායන මධ්‍යස්ථානයක් (අංක 01) ඉදිකිරීම (අදියර 1)





නාවික තටාකාංගනයේ පෞරාණික ගොඩනැගිලි නැවත සකස් කිරීම





වැලිසර නාවික කඳවුරේ ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරි විවාහක නිවාස ඉදිකිරීම - I අදියර





ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම





ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදි කිරීම





ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සය මහල් කණිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම





හම්බන්තොට නාවික හමුදා කඳවුරේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම (පස් මහල් කණිෂ්ඨ නාවික නිවාසය)





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ එළාර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම





වම්පස - 100%

දකුණුපස - ඉදිකරමින් පවති

උතුරු නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි 79ක් ඉදිකිරීම





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන මෙහෙයුම් මැදිරිය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය



කණිෂ්ඨ නාවිකයින්ගේ නේවාසිකාගාරය



නිලධාරි නිවාසය



පරිපාලන ගොඩනැගිල්ල



ජල කුලුන

ශ්‍රීලංනානෞ ශික්ෂා ආයතනයේ තෙමහල් ශාස්ත්‍රාලය ඉදිකිරීම





<u>උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම</u>





<u>ශ්‍රීලංනානෞ ශික්ෂා ආයතනයේ මුලුතැන්ගෙය, පොදු භෝජනාගාරය, ආහාරපාන ගබඩාව, නාවික ගබඩාව සහ බේකරි සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම</u>





<u>ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ආයතනයේ පණ්ඩුකාභයෙහි කනිෂ්ඨ නාවිකයින්ගේ නවාතැන් පහසුකම් සඳහා සිවිමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම</u>





<u>ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම</u>





ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම





2.1.14 ඇමරිකා එක්සත් ජනපදයෙන් 3 වන නෞකාව අත්පත් කර ගැනීම - ඇමරිකා එක්සත් ජනපදයේ 'Ex USCGS Douglas Munro' නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවට 2021 ඔක්තෝබර් 26 වැනි දින භාර දෙන ලදී. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින නෞකාවේ කාර්ය මණ්ඩලය (130) නෞකාවේ නඩත්තු/ අලුත්වැඩියා කටයුතු සිදු කළ අතර, මෙම නෞකාව 2022 සැප්තැම්බර් 03 වන දින ඇමරිකා එක්සත් ජනපදයෙන් පිටත් වූ අතර 2022 නොවැම්බර් 02 වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදි.





2.2 <u>නාවික හමුදාවේ ඉදිරි දැක්ම</u>

2.2.1 <u>ප්‍රගතිය සහ ඉදිරි දැක්ම</u>

නාවික හමුදාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර උපාය මාර්ගය 2025 යන ලේඛනය මගින් 2017 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කොට තිබූ අතර, එම සැලැස්ම තවදුරටත් 2030 වර්ෂය දක්වා නාවික හමුදාවේ ප්‍රධාන නෞකා සහ යාත්‍රා අවශ්‍යතාවයන් මත පහත සඳහන් වගුවේ ආකාරයට ක්‍රමාණුකූලව සංවර්ධනය කර ගැනීම සඳහා සැලසුම් කර ඇත.

යාත්‍රාව/ යාත්‍රා වර්ගය	**2022**	**2023**	**2024**	**2025**	**2026**	**2027**	**2028**	**2029**	**2030**	සමස්ත
ෆ්‍රිගේට්	-	-	-	සටහන i.	-	-	-	-	-	-
කොර්වෙට්ස්	-	-	01	-	-	-	-	-	-	01
අක්වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා (OPV)	09	-	01 (10)	-	-	-	-	-	-	10
වේග මිසයිල යාත්‍රා (FMV)	02	-	-	-	-	-	-	-	-	02
වේග මුර යාත්‍රා (FPB)	-	02	-	02 (04)	-	02 (06)	-	02 (08)		08
වේග ප්‍රහාරක යාත්‍රා (FAC)	49	-	-	-	-	-	-	-	-	49
ගොඩබෑමේ යාත්‍රා (LST/LCM/ LCU)	07			01 (08)				01 (09)	-	09
ගුවන් යානා අංශය	-	සටහන ii.	-	සටහන iii.	-	-	-	-	-	02
නියමුවන් රහිත ගුවන් යානා (UAV)	-	සටහන iv							-	02
වෙරළාරක්ෂක මුර යාත්‍රා	06	01								07
වෙරළාරක්ෂක යාත්‍රා	107	06	06	06	06	06	06	06	06	155

සටහන -

i. මෙම අවශ්‍යතාවය නැවත සලකා බැලිය යුතුය.
ii. ඩෝනියර් ගුවන් යානා අත්පත් කර ගැනීම.
iii. Rotor wing ඒකකය ස්ථාපිත කිරීම.
iv. UAV දෙකක් අත්පත් කර ගැනීම සමග ඒකකය ස්ථාපනය කිරීම.

2.2.2 තවද, දැනට සිදුවෙමින් පවතින නැව්, යාත්‍රා සහ අනෙකුත් අවශ්‍යතා අත්පත් කර ගැනීම පහත පරිදි වේ.

අ. **ඇමරිකා එක්සත් ජනපදයෙන් 3 වන නෞකාව අත්පත් කර ගැනීම**. ඇමරිකා එක්සත් ජනපදයේ 'Ex USCGS Douglas Munro' නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවට 2021 ඔක්තෝබර් 26 වැනි දින භාර දෙන ලදි. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින නෞකාවේ කාර්ය මණ්ඩලය (130) නෞකාවේ නඩත්තු/ අලුත්වැඩියා කටයුතු සිදු කළ අතර, මෙම නෞකාව 2022 සැප්තැම්බර් 03 වන දින ඇමරිකා එක්සත් ජනපදයෙන් පිටත් වූ අතර, 2022 නොවැම්බර් 02 වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදි.

ආ. **මීටර් 110-115 අතර දිගකින් යුත් අක්වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රාව කොළඹ නැව් තටාකාංගණය මගින් නිෂ්පාදනය කොට ලබා ගැනීම**. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව විශේෂ අයවැය ප්‍රතිපාදන යටතේ සීමා සහිත කොළඹ නැව් තටාකාංගනය පුද්ගලික සමාගම වෙතින් මීටර් 110 ක දිගකින් යුත් අක්වෙරළ මුර යාත්‍රාවක් නිෂ්පාදනය කර අත්පත් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තවද, මේ සඳහා 2022 වර්ෂයේ අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත. තවද, මිත්‍ර නාවික හමුදාව මගින් එම වර්ගයේ යාත්‍රා නොමිලේ ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.

ඇ. **මීටර් 35 – 45 අතර දිගකින් යුත් වේග මුර යාත්‍රා 10ක් කොළඹ නැව් තටාකාංගනය මගින් නිෂ්පාදනය කොට ලබා ගැනීම**. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව විශේෂ අයවැය ප්‍රතිපාදන යටතේ මීටර් 35 – 45 අතර දිගකින් යුතු වේග මුර යාත්‍රා 10ක් ශ්‍රී ලංකා නාවික හමුදාවට නිෂ්පාදනය කර ගැනීමට යෝජනා කර ඇත. සීමාසහිත කොළඹ නැව් තටාකාංගනය පුද්ගලික සමාගම වෙතින් පළමු වේග මුර යාත්‍රා දෙක ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති නමුත් මේ සඳහා 2022 වර්ෂයේ අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත. තවද, මිත්‍ර නාවික හමුදාව මගින් එම වර්ගයේ යාත්‍රා නොමිලේ ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.

ඈ. **ඇමරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් නෞකා සහ යාත්‍රා ලබා ගැනීම**. ඇමරිකාණු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් නෞකා සහ යාත්‍රා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලය වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇත.

1. Reliance Class Medium endurance cutter (210') නෞකා 01 ක්
2. Island - Class Patrol Boat (110') යාත්‍රා 04 ක්
3. Protector-Class Costal Patrol Boat (87') යාත්‍රා 03 ක්

ඉ. **චීන නැව් සමාගම මගින් ද මීටර් 95.6 ක දිගකින් යුත් නෞකාවක් නිෂ්පාදනය කොට ලබා ගැනීම**. චීන නැව් සමාගම මගින් ද මීටර් 95.6 ක දිගකින් යුත් නෞකාවක් නිෂ්පාදනය කොට ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. නමුත් මේ වන විට රටෙහි පවතින වත්මන් අර්ථික අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමන ලෙස උපදෙස් ලැබී ඇති අතර, ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි නැවත මෙම ව්‍යාපෘතිය සක්‍රීය කිරීම සඳහා ආරක්ෂක ලේකම් කාර්යාලය හරහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලිපියක් ඉදිරිපත් කොට ඇත.

ඊ. **ඩ්‍රෝන සමුද්‍රීය ගුවන් යානා දෙකක් ඉන්දීය නාවික හමුදාව මගින් අත්පත් කර ගැනීම**. ඉන්දියානු නාවික හමුදාවේ දැනට පවතින ඩ්‍රෝන සමුද්‍රීය ගුවන් යානයක් අවුරුදු 2ක් සඳහා ශ්‍රී ලංකාවේ සමුද්‍රීය මෙහෙයුම් සඳහා භාවිතා කිරීමට අදාළ සම්මුතිය 2022 මාර්තු 15 දින අත්සන් කරන ලද අතර, එම ගුවන් යානය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට භාර දීමේ උත්සවය 2022 අගෝස්තු මස 15 වන දින සිදු කරන ලදි.

.....

ප්‍ර.ග.නි./ ග.නි./ ආයතන ප්‍රධානියා

UVMP PERERA, RSP**, USP, ndu, psc
Vice Admiral
COMMANDER OF THE NAVY

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය (2022) (රු)	ඉකුත් වර්ෂය (2021) (රු)	
-	ආදායම් ලැබීම්		**247,000,000.00**	**110,000,000.00**	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
130,000,000.00	බදු නොවන ආදායම් සහ වෙනත්	4	247,000,000.00	110,000,000.00	
130,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**		**247,000,000.00**	**110,000,000.00**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		55,435,649,451.00	52,544,883,159.00	ඒසීඒ -3
-	තැන්පතු		754,179,788.00	521,988,344.00	ඒසීඒ -4
982,500,000.00	අත්තිකාරම් ගිණුම්		1,249,618,422.00	1,063,360,357.00	
-	වෙනත් ලැබීම්		-	-	
982,500,000.00	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**57,439,447,660.00**	**54,130,231,860.00**	
1,112,500,000.00	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ=(අ) + (ආ)**		**57,686,447,660.00**	**54,240,231,860.00**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**60,505,650.00**	**40,829,314.00**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) + (ඇ)		**57,625,942,010.00**	**54,199,402,546.00**	
	අඩු කළා: වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	ඒසීඒ - 2 (II)
41,250,040,000.00	වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	41,238,526,346.00	37,919,374,293.00	
20,631,050,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	14,331,609,707.00	13,478,791,955.00	
49,000,000.00	සහනාධාර,සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	43,859,745.00	49,935,938.00	
-	පොළී ගෙවීම්	8	-	-	
225,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	112,500.00	24,500.00	ඒසීඒ - 2 (II)
61,930,315,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**55,614,108,298.00**	**51,448,126,687.00**	
	මූලධන වියදම්				
2,670,000,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	1,902,228,836.00	3,097,318,352.00	

2,183,940,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	2,001,321,494.00	1,466,477,733.00	
515,200,000.00	ප්‍රාග්ධන පැවරීම්	12	515,200,000.00	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
440,000,000.00	හැකියා වර්ධනය	14	352,241,142.00	663,348,759.00	
1,106,000,000.00	වෙනත් මූලධන වියදම්	15	1,043,909,048.00	588,606,142.00	
6,915,140,000.00	**මුළු මූලධන වියදම (උ)**		**5,814,900,519.00**	**5,815,750,986.00**	
	තැන්පතු ගෙවීම්		776,684,126.00	495,825,440.00	ඒසිඒ-4
1,200,000,000.00	**අත්තිකාරම් ගෙවීම්**		1,383,105,898.00	958,141,769.00	ඒසිඒ- 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
1,200,000,000.00	**ප්‍රධාන ලෙජර් වියදම (ඌ)**		**2,159,790,024.00**	**1,453,967,209.00**	
	මුළු වියදම ඒ = (ඊ+උ+ඌ)		**63,588,798,841.00**	**58,717,844,881.00**	
-	**2021 දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය ඒ=(ඉ-එ)**		**(5,962,856,832.00)**	**(4,518,442,336.00)**	
	අඟ්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(5,964,744,421.00)	(4,521,517,786.00)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අඟ්‍රිමය ශේෂය		1,887,589.00	3,075,450.00	ඒසිඒ-3
			(5,962,856,832.00)	(4,518,442,336.00)	

3.3 **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

ඒසීඒ- පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය (2022) රු.	ඉකුත් වර්ෂය (2021) රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ -6	59,047,602,779.00	56,901,545,220.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ -5/5 (අ)	472,787,228.00	339,299,753.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ -3	1,887,589.00	3,075,450.00
මුළු වත්කම්		**59,522,277,596.00**	**57,243,920,423.00**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
භාණ්ඩාගාර වෙත ශුද්ධ වත්කම්		162,536,164.00	6,535,349.00
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		59,047,602,779.00	56,901,545,220.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ - 5 (බි)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ - 4	310,251,065.00	332,764,404.00
අග්‍රීම ශේෂය	ඒසීඒ - 3	1,887,589.00	3,075,450.00
මුළු වගකීම්		**59,522,277,596.00**	**57,243,920,423.00**

පිටු අංක 1 සිට 28 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ අකෘතිපත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 306 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
නම:	නම:	නම:
තනතුර:	තනතුර:	
දිනය : 27/2/2023	දිනය: 2023.02.22	දිනය: 2023.02.22

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩයි පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

UVMP PERERA, RSP**, USP, ndu, psc
Vice Admiral
COMMANDER OF THE NAVY

එල්එම් ශිරන්ති ජයසේන
අධ්‍යක්ෂ මුදල්
ශ්‍රී ලංකා නාවික හමුදාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය (2022) රු.	ඉකුත් වර්ෂය (2021) රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිහාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,471,558,748.00	2,901,935,757.00
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	55,432,574,000.00	52,512,242,402.00
අත්තිකාරම් අයකර ගැනීම	1,250,063,906.00	1,061,402,092.00
තැන්පතු ලැබීම්	753,908,536.00	521,988,344.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**59,908,105,190.00**	**56,997,568,595.00**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	50,679,138,370.00	47,785,961,546.00
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	43,972,245.00	49,960,438.00
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,017,802,861.00	2,299,659,747.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	60,505,650.00	54,004,723.00
අත්තිකාරම් ගෙවීම්	1,337,189,377.00	924,991,714.00
තැන්පතු ගෙවීම්	776,684,126.00	495,825,440.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**54,915,292,630.00**	**51,610,403,608.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	4,992,812,560.00	5,387,164,987.00
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	4,994,000,421.00	5,429,905,703.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	4,994,000,421.00	5,429,905,703.00
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(4,994,000,421.00)	(5,429,905,703.00)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(1,187,861.00)	(42,740,716.00)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**(1,187,861.00)**	**(42,740,716.00)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**3,075,450.00**	**45,816,166.00**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**1,887,589.00**	**3,075,450.00**

3.5 <u>මූල්‍ය ප්‍රකාශ සටහන්</u>

අ. <u>වාර්තා කිරීමේ පදනම</u>

(1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

(2) <u>මිනුම්කරණ පදනම</u>

(අ) මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

(ආ) මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම</u>

(අ) වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.6 <u>ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය</u>

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2001.03.00	ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය)	130,000,000.00	-	247,000,000.00	190.00%

3.7 <u>වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය</u>

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු)		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	58,243,315,000.00	61,930,315,000.00	55,614,108,298.00	89.80%
ප්‍රාග්ධන	6,059,940,000.00	6,915,140,000.00	5,814,900,519.00	84.09%

3.8 **මු.රෙ. 208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසාන කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන (රු)		
01	ජනාධිපති කාර්යාලය	විදුලි ගේට්ටුවක් සවි කිරීම සහ ශබ්ද විකාශන පද්ධතියක් සවිකිරීම කෝට්ටේ ශ්‍රී රජමහා විහාරය		2,759,127.95	27,132,420.68	36.52%
02		ධාතු මන්දිරය අලුත්වැඩියා කිරීම කෝට්ටේ ශ්‍රී රජමහා විහාරය		14,693,908.62		
03		දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම මැදිවක පල්ලේවෙල ශ්‍රී උපෝසථාරාම විහාරස්ථානය		8,276,567.74		
04		ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම මැදිවක පල්ලේවෙල ශ්‍රී උපෝසථාරාම විහාරස්ථානය		1,928,588.76		
05		තෙමහල් සංඝාවාසය ඉදිකිරීම මල්වතු මහා විහාරය		10,369,308.56		
06		පංති කාමරයක් පරිගණක විද්‍යාගාරයක් ලෙස බෙදා වෙන් කිරීම මැදිවක ප්‍රාථමික විද්‍යාලය		890,384.90		
07	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	කෝට්ටේ රජමහා විහාරස්ථානයේ උපෝසථ ගෙය සහ සතුකොට පූජා කිරීම වෙනුවෙන් පැවති උත්සවයේ කෙටි ආහාරපාන සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම		987,000.00	987,000.00	100.00%

08		නාගදීප රජමහා විහාරස්ථානයේ සිදුකර ඇති සංවර්ධන වැඩ කොටස් සඳහා අතැති බිල්පත් පියවීමට		2,083,156.39	2,040,581.04	97.96%
09	ආරක්ෂක අමාත්‍යාංශය	රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - ජනවාරි 2022		32,760,500.00	387,633,317.58	99.47%
10		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - පෙබරවාරි 2022		32,677,000.00		
11		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - මාර්තු 2022		32,627,000.00		
12		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - අප්‍රේල් 2022		32,614,500.00		
13		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - මැයි 2022		32,568,750.00		
14		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - ජුනි 2022		32,551,750.00		
15		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - ජුලි 2022		32,448,750.00		
16		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - අගෝස්තු 2022		32,466,000.00		
17		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - සැප්තැම්බර් 2022		32,316,750.00		
18		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - ඔක්තෝබර් 2022		32,316,750.00		
19		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - නොවැම්බර් 2022		32,174,250.00		
20		රණවිරු මාපියන් සඳහා වූ මාසික දීමනාව ගෙවීම - දෙසැම්බර් 2022		32,195,250.00		

21		මානුෂීය සහන සැපයුම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් ස්ථාපිත කිරීම		10,000,000.00	4,840,120.20	44.00%
22		මානුෂීය සහන සැපයුම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් ස්ථාපිත කිරීම		1,000,000.00		
23		රාජ්‍ය බුද්ධි සේවා තාක්ෂණික අංශයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම		379,080.26	1,927.80	0.51%
24	සෞඛ්‍ය අමාත්‍යාංශය	රිව්වේ ආර්යා ළමා රෝහලේ හෘද මධ්‍යස්ථානයක් ඉදිකිරීම		225,000,000.00	58,046,630.03	25.80%
25		රත්නපුර ශික්ෂණ රෝහල		6,120,990.23	11,328,268.30	93.17%
26		කෑගල්ල ශික්ෂණ රෝහල		6,037,659.39		
27	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	ත්‍රිවිධ හමුදා බස් ගමන් බලපත්‍ර වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම		13,500,000.00	13,499,768.22	100.00%
28	අධ්‍යාපන අමාත්‍යාංශය	කොළඹ ආනන්ද විද්‍යාලයේ පස්මහල් ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු		5,837,128.00	4,289,967.50	73.49%
29		කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයේ පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම		49,437,149.00	46,292,601.66	93.64%
30	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා වැටුප් හා දීමනා ගෙවීම		171,800.00	120,000.00	69.85%
31	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	ශාන්ත ජේම්ස් දේවස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම - කොළඹ 15		2,796,623.50	2,546,547.33	91.06%
32	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ජාතික කලාභවන ප්‍රතිසංස්කරණය		30,481,323.71	30,382,894.28	99.68%

33	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	ඉන්ධන සඳහා		471,178.97	444,922.17	94.43%
34		ආහාර සඳහා		991,045.04	573,984.86	57.92%
35				1,766,000.00	1,766,000.00	100.00%
36	බන්ධනාගාර මූලස්ථානය	බූස්ස බන්ධනාගාරය අලුත්වැඩියා කිරීම		699,623.28	685,583.28	97.99%
37		බූස්ස බන්ධනාගාරයේ ප්‍රධාන පිවිසුමේ CCTV පද්ධතියක් ස්ථාපනය කිරීම		344,414.00	326,560.00	94.82%
38		පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම		30,897,250.00	20,206,507.55	65.40%
39	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	රණවිරු දුබලතා දීමනාව		1,366,900,000.00	1,362,543,572.49	99.68%
40	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති යාත්‍රාවන්හි නඩත්තු කටයුතු සඳහා		36,138,216.35	15,065,558.67	14.47%
41		ශ්‍රීලංවෙඅා සුරක්ෂා නෞකාවේ නඩත්තු කටයුතු වෙනුවෙන්		68,000,000.00		
42	කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයේ පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම		103,747,149.00	20,562,850.14	19.82%
43		කොළඹ රාජකීය විද්‍යාල ගොඩනැගිල්ල ඉදිකිරීම		38,625,934.57	6,053,503.45	11.25%
44		කොළඹ ආනන්ද විද්‍යාලයේ පස්මහල් ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු		15,162,135.02		

3.9 <u>මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය</u>

වත්කම් කේතය	කේත විස්තරය	**2022.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2022.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	9,619,743,367.64	9,619,743,367.64	-	100%
9152	යන්ත්‍රෝපකරණ	46,556,492,464.80	46,556,492,464.80	-	100%
9153	ඉඩම්	2,785,263,725.00	2,785,263,725.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	86,103,221.24	86,103,221.24	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 <u>**විගණකාධිපතිවරයාගේ වාර්තාව**</u>

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන සම්පිණ්ඩන වාර්තාව සහ එම නිරීක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රකාශ ඇතුළත්ව ඉදිරිපත් කර ඇති වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙම වාර්තාව අවසානයේ අන්තර්ගත කොට ඇත.

04 පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත් කරුණු
		100% - 90%	75% - 89%	50% - 74%	
අධ්‍යක්ෂ ජෙනරාල් ඉංජිනේරු					
2103	ප්‍රාග්ධන විෂයයන් මිලදී ගැනීම සඳහා	100%			
	රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී න්‍යෂ්ඨික ඒකකය සඳහා	100%			
	වෙරළාරක්ෂක ක්‍රියාකාරකම් සඳහා මීටර් 20ක් දිග වෙරළාරක්ෂක මුර යාත්‍රා තැනීම සඳහා		82%		
	ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යන්ත්‍රෝපකරණ පරීක්ෂණ සහ අත්හදා බැලීම් ඒකකය පුළුල් කිරීම		75%		
2002	නෞකා සහ යාත්‍රා නඩත්තු කටයුතු හා අමතර කොටස් මිලදී ගැනීම සඳහා		82%		
	නෞකා සහ යාත්‍රා දියත් මගට ගැනීම සඳහා	90%			
2003	වාහන නවීකරණය, තහඩු හා පින්තාරු වැඩ කටයුතු සඳහා			73%	
1301	වාහන නඩත්තු කටයුතු සඳහා	93%			
2506	ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අත්පත් කර ගැනීමට නියමිත දියමත පාවෙන තටාකාංගනයට සමගාමීව ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයේ තාක්ෂණික වැඩපලවල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	100%			
අධ්‍යක්ෂ ජෙනරාල් සිවිල් ඉංජිනේරු					
	ගොඩනැගිලි හා ව්‍යුහ ඉදිකිරීම		88.0%		
	ගොඩනැගිලි හා ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීම			73.0%	
	යටිතල පහසුකම් සංවර්ධනය කිරීම		86.0%		
	ඉදිකිරීම් ව්‍යාපෘතීන්ට අදාළ යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනීම			65.0%	
අධ්‍යක්ෂ ජෙනරාල් සෞඛ්‍ය සේවා					
2103	ස්ථිර වෛද්‍ය සහ දන්ත වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	93.33%			
1204	ඖෂධ, ශල්‍ය පාරිභෝගික, රසායනාගර පාරිභෝගික, දන්ත ශල්‍ය පාරිභෝගික, රසායනාගාර පරීක්ෂණ , උපැස් හා දේශීය මිලදී ගැනීම්			53.88%	
ආඥාපති නාවික පාබල					
	ආඥාපති නාවික පාබල දෙපාර්තමේන්තුව වෙත විශයන් මිලදී ගැනීම			50%	

අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු

	විදේශීය පුහුණු	90%			
	දේශීය පුහුණු (අභ්‍යන්තර)	100%			
	දේශීය පුහුණු (බාහිර)	100%			
	නාවික විභාග හා විෂය නිර්දේශ	100%			

අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්

	අවි ආයුධ අමතර කොටස් මිලදී ගැනීම	90%	-	-	-
	යන්ත්‍ර උපකරණ සහ ඒ ආශ්‍රිත උපකරණ				
	සයිබර් ආරක්ෂණ ඒකකය				
	සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් මගින් ආදායම් ලබා ගැනීම				
	ජාත්‍යන්තර යාත්‍රා මෙහෙයුම්				
	පතොරම් මිලදී ගැනීම				

අධ්‍යක්ෂ නාවික සංගීත

	වැය ශීර්ෂ 2103 යටතේ 2021 වසරේ වාදක අංශය වෙත මිලදී ගත් සංගීත භාණ්ඩ සහ උපකරණ	-	-	52.8%	-

අධ්‍යක්ෂ ක්‍රීඩා

2103	වෙඩි තැබීම සඳහා භාවිතා කරන (කලිසම්, බූට්, ග්ලවුස්) මිලදී ගැනීම				30%
	කායවර්ධන උපකරණ මිලදී ගැනීම		80%		

අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා විද්‍යුත්

2103	නැව් සහ යාත්‍රා අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම			32.8%	වෙන් කරන ලද මුදල-රු.මි.42.00 වියදම් කරන ලද මුදල-රු.මි.13.77 (32.78%) 2022 වර්ෂයේ රට තුළ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් ප්‍රාග්ධන විෂයන් මිලදී ගැනීම අත්හිටවන ලදි.
2002	නැව්/ යාත්‍රා සහ ආයතනයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික පද්ධති/බලාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලුත්වැඩියා කිරීම/ නඩත්තු කිරීම/ වැඩිදියුණු කිරීම			54.06%	වෙන් කරන ලද මුදල-රු.මි.573.50 වියදම් කරන ලද මුදල-රු.මි.310.07 (54.06%) රුපියල් මිලියන 781 ක වැය සටහන් කර ඇති නමුත් රට තුළ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් සත්‍ය වියදම් දැරීමට හැකිව ඇත්තේ රුපියල් මිලියන 310.07 පමණි.

අධ්‍යක්ෂ නාවික තොරතුරු තාක්ෂණ

2103	පරිගණක හා උපාංග මිලදී ගැනීම			24.7%	ඉතිරි 75.3% ක ප්‍රමාණය ප්‍රතිපාදන නොමැති වීම නිසා අත්හිටුවනු ලැබීය.

ප්‍රධාන ජලශාස්ත්‍රීය සේවා

2103	මිලදී ගැනීම්			67.5%	

අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා

2102	මිලදී ගැනීම්		74.19%		
2103	මිලදී ගැනීම්			59.76%	

ආහාර හා නිල ඇඳුම්

1203	ආහාර		76.38%		
	නිල ඇඳුම්				45.72%

විදේශීය මිලදී ගැනීම්

2101	මිලදී ගැනීම්	100%			
2002	මිලදී ගැනීම්				33%
2103	මිලදී ගැනීම්				45%

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 **හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු**. යටිතල පහසුකම් ගොඩනැගීම, තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

ඉලක්ක/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% - 74%	75% - 100%
අන්තර්ජාතික සහයෝගීතාව ද ලබා ගෙන ප්‍රචණ්ඩතාවය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සහ අපරාධ තුරන් කිරීම සඳහා විශේෂයෙන්ම දියුණු වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම මට්ටම්වල අදාළ ජාතික ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම.	සියලුම විධානයන් ආවරණය වන පරිදි විශේෂ කාර්ය බල කණ්ඩායම් අනුයුක්ත කර අදාළ ප්‍රදේශයන්හි ආරක්ෂාව තහවුරු කිරීම සහ තෝරාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් වටලා සෝදිසි කිරීම් සිදු කිරීම.	වැටලීම් සිදු කිරීම.	72%		
		විශේෂ ආරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම			85%
		වෙරළ තීරය ආවරණය වන පරිදි වෙරළ ආරක්ෂක කණ්ඩායම් අනුයුක්ත කිරීම.			80%
නාවික මහ රෝහල (කොා) හි පහසුකම් වැඩි දියුණුකර තෘතීක ප්‍රතිකාර සපයන රෝහලක් බවට පත්කිරීම	නාවික මහ රෝහල (කොළඹ) හි වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ බාහිර රෝගී අංශය වෙත වෙනත් නාවික විධානයන් වෙතින් පැමිණෙන නාවික පුද්ගලයින් සඳහා නවාතැන් පහසුකම් සහ ආහාර ගැනීම සඳහා මහල් 04 කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නියමිතව ඇත.		2024 වර්ෂයේ ප්‍රාග්ධන විෂයයන් සඳහා ඉල්ලුම් කර ඇත		
කොවිඩ් 19 රෝගය හේතුවෙන් සිදු වන මරණ හා අතුරු ආබාධ අවමකර ගැනීම.	දකුණු නාවික විධාන රෝහලෙහි කොවිඩ් 19 අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා ඇඳන් 07කින් යුතු දැඩි සත්කාර ඒකකයක් ස්ථාපනය කිරීම.				100%
නාවික මහ රෝහල කොළඹ හරිත සංකල්පය යටතේ ක්‍රියාත්මක වන රෝහලක් වන බැවින් විදුලි ජනනය සඳහා යන වියදම් අඩු කිරීම	නාවික මහ රෝහල (කොළඹ) හි විදුලි බිල අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බල පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය සඳහා ඇතුළත් කර ඇත.		10%		

නාවික මහ රෝහල (කොළඹ) හි පහසුකම් වැඩි දියුණුකර තෘතීක ප්‍රතිකාර සපයන රෝහලක් බවට පත්කිරීම	නාවික මහ රෝහල (කොළඹ) රෝග නිශ්චය හා ප්‍රතිකාර කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මහල් 06 කින් සමන්විත ගොඩනැඟිලි ව්‍යාපෘති වාර්තාව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියෙන් පසු ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) අනුමැතිය සඳහා යොමුකර ඇත.		10%		
නාවික මහ රෝහල (කොළඹ) හි බාහිර රෝගීන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම	බාහිර රෝගී අංශය පුලුල් කිරීමේ අරමුණින් නාවික මහ රෝහල කොළඹ වෙත මහල් 02 කින් යුතු ගොඩනැඟිල්ලක් ඉදිකිරීම.			50%	
නීති විරෝධී ලෙස රට තුළට ගෙන එන මත්ද්‍රව්‍ය වැළැක්වීම	නීති විරෝධීව රට තුළට රැගෙන එන මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම	**<u>නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම - 2022.01.01 සිට 2022.12.31 දක්වා</u>** • හෙරොයින් - කි.ග්‍රෑ. 1363.503297 • ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්) - කි.ග්‍රෑ. 148.147581 • කේරළ ගංජා - කි.ග්‍රෑ. 5731.155 • දේශීය ගංජා - කි.ග්‍රෑ. 25.285 / පැළ 41685 • හෂීස් - කි.ග්‍රෑ. 1.105711 • කුෂ් - කි.ග්‍රෑ. 0.000300 • මෝදක - ගණනින් 1725 • මත්පෙති - ගණනින් 665033 • ගෝඩා - ලීටර් 210 • කසිප්පු - ලීටර් 162.501 • අබිං - ග්‍රෑම් 12 • මත් මුද්දර - ගණනින් 32			
නීති විරෝධී ලෙස රට තුළට භාණ්ඩ ගෙන ඒම වැළැක්වීම	නීති විරෝධීව රට තුළට රැගෙන එන භාණ්ඩ අත්අඩංගුවට ගැනීම	**<u>නීති විරෝධී භාණ්ඩ අත්අඩංගුවට ගැනීම - 2022.01.01 සිට 2022.12.31 දක්වා</u>** • බීඩි කොළ - කි.ග්‍රෑ. 17315.330			

		• දුම්වැටි- ගණනින් 54900 • කෘමි නාශක - බෝතල් 36419 • රත්‍රං - කි.ග්‍රෑ. 2.384 • මත්පැන් - බෝතල් 182 • කහ - කි.ග්‍රෑ. 2087.770 • එනසාල් - කි.ග්‍රෑ. 192.000			
අනවසර සංක්‍රමණ කටයුතු වැළැක්වීම	නීති විරෝධීව ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම	**<u>නීති විරෝධී ලෙස සංක්‍රමණය වන පුද්ගලයින් හා යාත්‍රා අත්අඩංගුවට ගැනීම - 2022.01.01 සිට 2022.12.31 දක්වා</u>** • මුහුදේ දී අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන - 947 • අවස්ථා ගණන - 30 • ගොඩබිමෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 374 • අවස්ථා - 33 • අත්අඩංගුවට ගත් යාත්‍රා ගණන - 31			
නීති විරෝධී ධීවර ක්‍රියාකාරම් වැළැක්වීම	නීති විරෝධී ලෙස ධීවර කටයුතුවල නියැලෙන පුද්ගලයින් සහ යාත්‍රා අත්අඩංගුවට ගැනීම	**<u>නීති විරෝධී ලෙස ධීවර කටයුතු සිදු කරනු ලබන පුද්ගලයින් හා යාත්‍රා අත්අඩංගුවට ගැනීම - 2022.01.01 සිට 2022.12.31 දක්වා</u>** • ට්‍රෝලර් යාත්‍රා - 22 • ඩිංගි යාත්‍රා - 109 • වල්ලම් - 02 • ඔරු - 03 • නීති විරෝධී දැල් ආම්පන්න - 1250 • වෝටර් ජෙල් - කි.ග්‍රෑ. 149.312 • පුද්ගලයින් - 559			
2022 වසර ආරම්භයේ දී බලඝණය සතුව 298ක් වන සුදුසුකම් ලත් ජීවිතාරක්ෂකයින් සිටි අතර, එම පුහුණු වර්ෂය තුළ අලුතින් ජීවිතාරක්ෂක නාවිකයින් 110ක් බිහි කිරීමට අපේක්ෂා කළ අතර, වර්ෂ අවසානය වන	වර්ෂය තුළ අලුතින් ජීවිතාරක්ෂක නාවිකයින් 110ක් බිහි කිරීම	වර්ෂ අවසානයේ වන විට 87 දෙනෙකු සඳහා අන්තර්ජාතික ජීවිතාරක්ෂක නාවිකයින් අතරමැදි, ලෝකඩ සහ රිදී පදක්කම් සුදුසුකම් ලබා ගන්නා ලදි			79%

විට 87 දෙනෙකු සඳහා අන්තර්ජාතික ජීවිතාරක්ෂක අතරමැදි, ලෝකඩ සහ රිදී පදක්කම් සුදුසුකම් ලබා ගන්නා ලදි.					
සුදුසුකම් ලත් පුහුණු ජීවිතාරක්ෂක උපදේශකයින් බිහි කිරීම	ජීවිතාරක්ෂක පුහුණු උපදේශකයින් ලෙස 20 දෙනෙකු සුදුසුකම් ලබා ගැනීම	පුහුණු උපදේශකයින් ලෙස 20 දෙනෙකු සුදුසුකම් ලබා ගන්නා ලදි			100%
2021 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික නාගරික සෙවීම් සහ ගලවා ගැනීමේ පළමු ප්‍රතිචාර දක්වන්නන් 75ක් පුහුණු කළ අතර, 2022 වර්ෂයේදී නව ප්‍රතිචාර දක්වන්නන් 124ක් බිහි කිරීම	නාගරික සෙවීම් සහ ගලවා ගැනීමේ පළමු ප්‍රතිචාර දක්වන්නන් 124 දෙනෙකු පුහුණු කිරීම	නාගරික සෙවීම් සහ ගලවා ගැනීමේ පළමු ප්‍රතිචාර දක්වන්නන් 124 දෙනෙකු පුහුණු කරන ලදි (අවසාන පාඨමාලාව ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය මඟින් අවලංගු කර තිබීම හේතුවෙන්)			100%
සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිතද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.	බිත්තර අවශ්‍යතාවය ලබා දීම	අ. බිත්තර අවශ්‍යතාවය සපුරා ලීම සඳහා දැනටමත් ශ්‍රීලංනානෞ කාශ්‍යප ආයතනයෙහි ගම් කුකුලන් යොදා ගනිමින් කාබනික බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතියක් (Organic Egg Production Farm Project) පවත්වාගෙන යන අතර, මේ වන විට ගම් කුකුලන් හා කිකිලියන් සංඛ්‍යාව 60 කින් සමන්විත වේ.	2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ගම් කුකුළු බිත්තර නිෂ්පාදනය 253 කි.		
		ආ. තවද, වර්තමානයේ රට තුළ පවතින ආර්ථික අර්බුධය හමුවේ අපේක්ෂිත ඉලක්ක කරා සංවර්ධනය කර ගැනීම සඳහා යෙදවීමට අවශ්‍ය ලේයර් සතුන් හා ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම දුෂ්කර කාර්යයක් වී ඇති බැවින්, මහා පරිමාණයෙන් බිත්තර නිෂ්පාදනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.			

<u>විදේශීය පුහුණු</u> ශ්‍රී ලංකා නාවික හමුදාවේ මානව සම්පත් සංවර්ධනය සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු දෙපාර්තමේන්තුව මගින් විදේශීය පුහුණු පාඨමාලාවන් වාර්ෂික පුහුණු සැලැස්මකට අනුව පවත්වාගෙන යාම.	විදේශීය පාඨමාලා සහ පුහුණු සැසිවාර මගින්, ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත නාවික හමුදා පුද්ගලයන්ගේ වෘත්තීමය දැනුම, කුසලතා සහ ආකල්ප විදේශීය නාවික ආයතනයන් තුළින් වර්ධනය කර ගැනීම	2022 දෙසැම්බර් මස 31 වන දිනට පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව - 210 නාවිකයින් සංඛ්‍යාව - 102			100 %
<u>දේශීය පුහුණු -අභ්‍යන්තර</u> නාවික හමුදාවේ නාවික පුද්ගලයින් සඳහා අභ්‍යන්තර පාඨමාලාවන් ලබා දීම මගින් නාවික පුද්ගලයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම	නාවික හමුදාවේ රාජකාරි කර ගැනීම සඳහා දැනුමෙන් පරිපූර්ණ නාවික පුද්ගලයින් පිරිසක් බිහි කිරීම	පුහුණුව ලත් නිලධාරීන්- 358 පුහුණුව ලත් නාවිකයින්- 7378			100 %
<u>දේශීය පුහුණු - බාහිර</u> නාවික හමුදාවේ නාවික පුද්ගලයින් සඳහා බාහිර පාඨමාලාවන් ලබා දීම මගින් නාවික පුද්ගලයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම.	නාවික හමුදාවේ රාජකාරි කර ගැනීම සඳහා දැනුමෙන් පරිපූර්ණ නාවික පුද්ගලයින් පිරිසක් බිහි කිරීම	දේශිය පුහුණු (බාහිර) පුහුණුව ලත් නිලධාරීන්- 566 පුහුණුව ලත් නාවිකයින්- 540			100 %
<u>නාවික විභාග හා විෂය නිර්දේශ</u> නාවික හමුදාව තුළ පවත්වනු ලබන විභාග හා පරීක්ෂණ කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව සිදු කිරීමට කටයුතු කිරීම.	නාවික හමුදාව තුළ නිලධාරීන්ගේ හා නාවිකයින්ගේ උසස්වීම්වලට අදාළ විභාගයන් නිසි කාලසීමාවට හා ක්‍රමානුකූලව පැවැත්වීම	සහභාගි වූ පිරිස			90%
	නාවික හමුදාව තුළ නිලධාරීන්ට හා නාවිකයින්ට අදාළ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම	සහභාගි වූ පිරිස	90%		
	නාවික හමුදාව තුළ නිලධාරීන්ට හා නාවිකයින්ට අදාළ පිහිණුම් ප්‍රවීණතා පරීක්ෂණ පැවැත්වීම	සහභාගි වූ පිරිස	90%		
ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක	ත්‍රිකුණාමලයෙහි නෞකා තඨාකංගණ ජැටිය ඉදි කිරීම (ෆෙන්ඩර් සහ බොලාර්ඩ් සහිත ජැටිය ඉදිකිරීම)	නැව් සඳහා නැංගුරම් පහසුකම් සංඛ්‍යාව	39.9%		
	ශ්‍රී ලංකා නාවික හමුදාවේ යූඑච්එෆ් වීඑච්එෆ් සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය		60%	

වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	මීටර් 110 ක් දිගැති ගැඹුරු මුහුදු නිරීක්ෂණ නෞකාවක් මිල දී ගැනීම	නාවික හමුදාව සතු ප්‍රධාන නෞකා සංඛ්‍යාව	5%		
	මීටර් 45 ක් දිගැති වේගමුර සංචාරක යාත්‍රා 2ක් මිල දී ගැනීම	වේගමුර සංචාරක යාත්‍රා සංඛ්‍යාව	5%		
	විද්‍යුත් දෘෂ්‍ය උපකරණ මිල දී ගැනීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය	20%		
	ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අත්පත් කර ගැනීමට නියමිත දිය මත පාවෙන තටාකාංගනයට සමගාමීව ත්‍රිකුණාමලයේ පිහිටි නාවික තටාකාංගනයෙහි තාක්ෂණික වැඩපලවල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය		60%	
	අධිපීඩන ඔක්සිජන් ප්‍රතිකාර (HBOT) කිරීමේ කුටිය(Recompression Chamber) x 02ක් මිලදී ගැනීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය		60%	
	අක්වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රාවක් (OPV) සඳහා ප්‍රධාන ආයුධ මිලදී ගැනීම.	ව්‍යාපෘතියේ ප්‍රගතිය	5%		
	ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යන්ත්‍රෝපකරණ පරීක්ෂණ සහ අත්හදා බැලීම් ඒකකයMachinery Testing and trial unit MTTU වැඩි දියුණු කිරීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය		62%	
	ස්ථාවර මධ්‍යම පරාසයේ ආයුධ පද්ධති(Stabilized medium range weapon system) ස්ථාපනය කිරීම (23mm)	ව්‍යාපෘතියේ ප්‍රගතිය	5%		
	ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා යාත්‍රා සහ ආයතනවල භාවිත වන යල්පැනගිය විදුලි සහ විද්‍යුත් පද්ධති, උපකරණ සහ යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම(EOSS 09)	ව්‍යාපෘතියේ ප්‍රගතිය		54%	
	නෞකා සමූහයේ ප්‍රධාන නැව් සඳහා බ්‍රෝඩ්බෑන්ඩ් සන්නිවේදන පද්ධති (Fleet Broadband Communication system) හඳුන්වා දීම.	ව්‍යාපෘතියේ ප්‍රගතිය	10%		

	ශ්‍රී ලංකා නාවික පුද්ගලික ස්වයං ශාඛා භූවමාරු මධ්‍යස්ථානය (PABX) සහ ජාලය වැඩිදියුණු කිරීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය	20%		
	ශ්‍රී ලංකා නාවික හමුදාවේ ක්ෂුද්‍ර තරංග (Microwave Network) සන්නිවේදන ජාලය යාවත්කාලීන කිරීම	ව්‍යාපෘතියේ ප්‍රගතිය	35%		
ජල පෙරන යන්ත්‍ර නිෂ්පාදනය කිරීම	මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා වෛද්‍ය ප්‍රති ආශ්‍රැතිකරණ, කිවුල් ජල ප්‍රති ආශ්‍රැතිකරණ, මුහුදු ජල ප්‍රති ආශ්‍රැතිකරණ ජල පෙරණ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම.	නිෂ්පාදනය කරන ලද ප්‍රති ආශ්‍රැතිකරණ ජල පෙරණ යන්ත්‍ර සංඛ්‍යාව මුහුදු ජල ප්‍රති ආශ්‍රැතිකරණ ජල පෙරණ යන්ත්‍ර සංඛ්‍යාව - 04 වෛද්‍ය ප්‍රති ආශ්‍රැති ජල පෙරණ පද්ධති - 04 කිවුල් ජල ප්‍රති ආශ්‍රැතිකරණ පද්ධති - 51			100%
කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්	i. තැලසීමියා ඉන්ෆියුෂන් පද්ධති 400ක් නිෂ්පාදනය කිරීම. ii. ශ්‍රී ලංකා නාවික නෞකා/ යාත්‍රා සඳහා ඇනිමෝමීටර 04 ක් නිෂ්පාදනය කිරීම. iii. නාවික හමුදා මූලස්ථානය සඳහා පුද්ගලයින් හඳුනා ගැනීමේ පද්ධතියක් හඳුන්වාදීම. iv. ආබාධිතයින් සඳහා වෙරළේ භාවිතයට සුදුසු රෝද පුටුවක් නිෂ්පාදනය. v. ස්වයංක්‍රීය ස්වාධීන වඩදිය විවලන අධීක්ෂණ පද්ධති 02ක් නිෂ්පාදනය කිරීම. vi. රැහැන් රහිත ගිනි අනතුරු ඇඟවීමේ පද්ධතියක් නිෂ්පාදනය කිරීම. vii. තත්කාලීන බලශක්ති විගණන සහ ගොඩනැගිලි ස්වයංක්‍රියකරණ පද්ධතියක් නිෂ්පාදනය කිරීම.				**75%** **100%** **80%** **75%** **75%** **100%** **100%** **75%**

	viii. දුරස්ථව ක්‍රියාත්මක වන ජීවිතාරක්ෂක බෝයාව. ix. සමීප සටන් පුහුණුව සඳහා ස්මාර්ට් ඉලක්ක සහිත කුඩා ආයුධ වෙඩි තැබීමේ සිමියුලේටරය වැඩිදියුණු කිරීම. x. ස්නයිපර් සහ වෙඩික්කරුවන් සඳහා දිගු දුර වෙඩි තැබීමේ සමාකෘතිය				**75%** **75%**

5.2 තිරසාර අරමුණු සඳහා ලඟාවීමට අදාළව නාවික හමුදාවේ විවිධ දෙපාර්තමේන්තු මඟින් විවිධ ක්‍රියාකාරකම්වල නියැලෙන නමුත් එම තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ලඟා කරගන්නා ආකාරය සම්බන්ධයෙන් උක්ත ආකෘතිය පරිදි ප්‍රතිශාතාත්මක ඇගයීමක් සිදු කිරීම ප්‍රායෝගිකව දුෂ්කරය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

නාවික

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**
නිලධාරීන්	3670	3224	446
නාවිකයින්	49330	44667	4663

නාවික සිවිල්

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**
ජ්‍යෙෂ්ඨ	10	6	4
තෘතීයික	13	2	11
ද්විතීයික	145	73	72
ප්‍රාථමික	1768	1288	180

6.2 ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවා පුද්ගලයින් හා සිවිල් පුද්ගලයින් යන දෙඅංශයේම පුරප්පාඩු පවතී.

අ. **නාවික**

නාවික හමුදාවේ අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 9.63% කට අධික පුරප්පාඩු පවතින නමුත් දැනට පවතින මානව සම්පත කළමනාකරණය කිරීමෙන් රාජකාරි කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආ. **නාවික සිවිල්**

(1) නාවික හමුදාවේ සිවිල් සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 13.79% කට අධික පුරප්පාඩුවක් පවතී.

(2) ප්‍රාථමික ද්විතියික හා තෘතික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හිඟයට හේතු වී ඇති අතර, එය මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය අඩු කිරීමට සැළකිය යුතු බලපෑමක් සිදු කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
දේශීය පුහුණු (අභ්‍යන්තර)	7736	2022 ජනවාරි මස 01 වන දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා	30,000,000.00		දේශීය	මානව සම්පත් සංවර්ධනය
දේශීය පුහුණු (බාහිර)	2805		28,000,000.00		දේශීය	
විදේශීය පුහුණු	312			339,750,000.00	විදේශීය	
නාවික විභාග පැවැත්වීම	7300		2,250,000.00		දේශීය	
එකතුව	18153		400,000,000.00			

නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයින්ගේ වෘත්තීන්ට අදාළව දැනුම සහ තාක්ෂණය හුවමාරු කර ගැනීම තුළින් නාවික හමුදාවට ඵලදායී සේවයක් ලබා ගැනීමට හැකි වීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන (මූ.රෙ 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්මේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 2ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය	අනුකූලවේ		

	සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	වාහනවල දෛනික ධාවන සටහන් එම වාහන අදාළ ආයතනයේ පවත්වා ගනු ලබන අතර, මාසික සාරාංශ වාර්තා අදාළ ආයතන වෙතින් මාසිකව නාවික හමුදා මූලස්ථානය වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීමට මෙතෙක් උපදෙස් ලැබී නොමැති බැවින් ඉදිරිපත් කර නොමැත.	මෙම තොරතුරු විගණකාධිපති වෙත යැවීම උපදෙස් ලබා දුන් පසු ඒ අනුව කටයුතු කරනු ලැබේ.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේහි පවතින වාහන අවශ්‍යතා සැලකිල්ලට ගෙන වාහන අපහරණය කිරීමේදී ඒ සඳහා අනුප්‍රාප්තික වාහන එම වාහන අපහරණයට ලක් කිරීමට යෝජිත වාහන අයත් කදවුරු වෙත අනුයුක්ත කිරීම සඳහා දැනට තිබෙන ප්‍රතිපාදන හා රජය මගින් පනවනු ලබන වාහන මිලදී ගැනීම් අවම කිරීමේ චක්‍ර ලේඛන සැලකිල්ලට ගෙන අත්‍යවශයෙන්ම අපහරණය කළ යුතු වාහන පමණක් අපහරණය කරනු ලබයි.	වාර්ෂික සංඝණනයේදී අපහරණය කිරීමට තෝරාගනු ලබන වාහන අදාළ ක්‍රියා පටිපාටිය අවසානයේදී අපහරණ ක්‍රියාවලිය(G 47) සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී ගබඩා පාලන අංගණය වෙත භාර දීමට කටයුතු කරනු ලැබේ. මේ වන විට එසේ අපහරණය කිරීමට (G 47) ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී ගබඩා පාලන අංගණය වෙත භාර දීමට

				තෝරාගත් වාහන කිසිවක් නොමැත. නමුත් මූල්‍යමය හෝ වෙනත් හේතූන් මත මාස 06කට වඩා කාලයක් අලුත්වැඩියා කටයුතු සඳහා අක්‍රීයව පවතින වාහන පවතින අතර එම වාහන ධාවන තත්වයට පත් කිරීම සඳහා අවශ්‍යය කටයුතු කරනු ලැබේ.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සිමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම	
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවි හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	-	-	

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	-	-	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	වාර්ෂිකව නාවික හමුදාවේ ඒ ඒ අංශයන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට අදාළව සැලසුම් සකස් කරනු ලබයි.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේ පවතින රාජකාරී ස්වභාවය හා ක්‍රියා පටිපාටියට අනුව රාජකාරීන් හා වගකීම් පවරනු ලබන අතර, අවස්ථානුකූලව ඊට අදාළ ගිවිසුම්ගත වීම් සිදු කරනු ලබයි	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඊඑෆ්/බී/එස්එල්එන්/2022/02/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 29 දින

NAVAL HEADQUARTERS
31 MAY 2023
(3) SECRETARIAT

නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2.ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඩීඊඒඑන්/බී/එස්එල්එන් /2022/02/13 ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 මැයි 29 දින

නාවික හමුදාධිපති

ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2022 වර්ෂයේ නාවික හමුදාවේ ඉන්ධන සැපයීම් වැය ලෙජරයේ රු. 5,190,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 971,051,975 ක් හෙවත් සියයට 19 ක් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන හා බාහිර ආයතන සඳහා නිකුත් කර තිබුණු අතර, එයින් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට අයවීමට තිබුණු රු. 22,548,339 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

1.6.2 අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුම අනුව ණය ශේෂය රු. 479,940,311 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු. 458,314,685 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු. 21,625,626 ක වෙනසක් විය. මේ වෙනස සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත්කළ කමිටුවක් මඟින් මෙම ණය ශේෂ වෙනස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන කපා හැරීම සඳහා නිර්දේශකර තිබුණ ද මේ දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය)

(i) මුදල් රෙගුලාසි 504 අනුව අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක එක් එක් කාර්තුවක් අවසානයේ දී වෙළඳ ණය ගැතියන් පිළිබඳ, වෙළඳ ණයහිමියන් පිළිබඳ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් පිළිබඳ සහ අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිළියෙල කර එම කාර්තුවට පසුව එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත එවිය යුතු වුවත්, මෙම ගිණුම සම්බන්ධයෙන් එකී ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම වෙළඳ ණය ගැතියන් , වෙළඳ ණයහිමියන් සහ අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් පිළිබඳ ප්‍රකාශයන් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සමඟ ද ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2021 වර්ෂයට අදාලව වැඩිපුර ගෙවා තිබුණු රු. 1,872,557 ක් වූ වැට් බදු වටිනාකම හා වැඩිපුර ලැබූ රු.1,532,440ක් වූ අත්තිකාරම් වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදී ජර්නල් වවුචර් පිළියෙල කර අනුමත කර ගැනීමකින් තොරව අත්තිකාරම් ගිණුමට ගලපා තිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ පාලන ගිණුම හා කේවල ශේෂ අතර 2001 වර්ෂයේ සිට පැවත එන රු. 21,625,626 ක් වූ වෙනස පරීක්ෂා කිරීම සඳහා අදාල වන තොරතුරු, ලේඛණ, ගිණුම් සාරාංශයන් හි පිටපත් නාවික හමුදාව සතුව නොපැවතුණි. 2003, 2004 හා 2005 වර්ෂයන්වල පාලන ගිණුමේ හා කේවල ශේෂ අතර වෙනස පිලිවෙලින් රු. 11,297, රු. 10,431 හා රු. 31,668,645 වන බවත් අස්වාභාවික ලෙස 2005 වර්ෂයේදී මෙම වෙනස ඉහල ගොස් ඇති බවත් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, 2022 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 06 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු. 701,200,000 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04(6) වගන්තිය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 94 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු අතරම නියම වශයෙන් මුදල් ගෙවීමට සිදු වන කාලය වන විට අවශ්‍ය අධිකාරි බලය හෙවත් අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබේ යැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් හෝ නොදැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන ඉක්මවා පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.15,358,654 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා රු. 82,126,924 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන iii මඟින් දක්වා තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ නාවික හමුදාවට අදාළ නොවන වැය විෂයයන් 02 ක් වෙනුවෙන් රු.1,523,936 ක් වටිනා බැරකම් සඳහා එළඹ තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන iii මඟින් දක්වා තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව නාවික හමුදාව විසින් 2021 වර්ෂයේ දී ඇතිකර ගන්නා ලද රු. 83,369,954 ක් වූ බැඳීම් 40 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි.

2.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 2018 ජූලි 16 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය	අනුයුක්ත වාහනයක් සඳහා හිමිකම් ඇති නිලධාරියකු හිමිකම් ලබන්නේ එක් අනුයුක්ත වාහනයක් සඳහා පමණක් බවට සියළු රාජ්‍ය ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු බවත්, අනුයුක්ත වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් වෙනත් කිසිදු සංචිත වාහනයක් භාවිතා කිරීමට හිමිකම් කියනු නොලබන බවත් දක්වා තිබුණ ද, නාවික හමුදාවේ නිලධාරීන් 18 දෙනෙකු සඳහා අනුයුක්ත වාහන දෙක බැගින් වෙන්කර තිබුණි.
(ආ) රාජ්‍ය සේවා පළාත් සහා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	(i) පෙට්‍රල්/ ඩීසල් වාහන භාවිතා කරන, අනුයුක්ත කල නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට මාසිකව ලීටර් 135 ක් අනුමත කර තිබියදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු සිවිල් නිලධාරීන් 03 ක් වෙනුවෙන් රාජකාරී ගමන් සඳහා මසකට ලීටර් 365 ක් බැගින් හා ඒ අතරින් සිවිල් නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් පෞද්ගලික ගමන් සඳහා මසකට ලීටර් 125 ක් බැගින් අනුමත කර තිබුණි.
	(ii) නාවික හමුදාපතිගේ අංක 0325 දරන නාවික නියෝගයේ 47 වගන්තිය මඟින් හා 2020 පෙබරවාරි 13 දිනැති නා.හ. 05 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් කමාන්ඩර් හා ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් 583 ක් සඳහා පැවති රාජකාරී ඉන්ධන සීමාව ලීටර් 305 සිට 365 දක්වා ද, කොමදෝරු තනතුර හා ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් 101 ක් සඳහා රාජකාරී ඉන්ධන ප්‍රමාණයට අමතරව පෞද්ගලික කටයුතු සඳහා ලීටර් 125 ක ඉන්ධන ප්‍රමාණයක් ද අනුමත කර තිබුණ ද, ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

		පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය	පෞද්ගලික ආයතන දෙකකින් වාහන 03ක් ද, රජයට සම්බන්ධ ආයතන දෙකකින් වාහන 06 ක් ද, අත්අඩංගුවට ගත් වාහන 50 ක් ද ඇතුළුව වාහන 59 ක් නාවික හමුදාව සතුව ඇති අතර චක්‍රලේඛය ප්‍රකාරව එම වාහනවල ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) 3.1.4 (i) (ii) (iii) හා (iv) වගන්ති	සමාලෝචිත වර්ෂයට අදාලව නියැදි විගණන පරීක්ෂාවට අනුව වටිනාකම රු. 66,345,710 ක් වූ රතු පොස්පරස් සහ උණ්ඩ මිලදී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීම් ක්‍රමය යටතේ සිදුකර තිබුණු අතර උපරිම තරගයක් තහවුරු කිරීම සඳහා විවිධ මාධ්‍ය මගින් ප්‍රසම්පාදන දැන්වීම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් ලබාදිය යුතු බවට ප්‍රසම්පාදන අස්තිත්වයට නියම කරනු ලබන අතර ජාත්‍යන්තර වශයෙන් සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් සහභාගී වීමට අවකාශ ඇති රටවල තානාපති කාර්යාලවලට , වෙළඳ නියෝජිතයන්ට එම දැන්වීම ප්‍රේෂණය කිරීම සහ වෙබ් අඩවිවල එම දැන්වීම් පළකිරීම කළ යුතු වුවත්, ප්‍රසම්පාදන දැන්වීම ජාතික පුවත්පතක සහ නාවික හමුදා වෙබ් අඩවියේ පමණක් පළකර තිබීම හේතුවෙන් ජාත්‍යන්තර තරගකාරී සැපයුම්කරුවන්ට ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගී වීමට තිබූ අවස්ථා අවම වී තිබුණි.
	(ii) 6.3.6 වගන්තිය	ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගත කළ යුතු වුවත් එක් එක් ලංසු පිළිබඳ නිරීක්ෂණ සහ මූල්‍ය තොරතුරු එම ආකෘති ප්‍රකාරව වාර්තා ගතකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

මීගමුව බෝලවලාන සාන්ත බෙනඩික් අධ්‍යයන ආයතනයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිණිස ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික කාර්යය මණ්ඩලය 2019 දෙසැම්බර් මස සිට යොදවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නීරීක්ෂණය කරනු ලැබේ.

(අ) පෞද්ගලික ආයතනයක් වූ සාන්ත බෙනඩික් අධ්‍යයන ආයතනය සමඟ ගිවිසුමකට එලඹීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි.

(ආ) නාවිකයින් 25 දෙනෙකු මාස 06 ක කාලයක් ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදවීමට ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් තවදුරටත් මාස 09 ක කාලයකට එකී ව්‍යාපෘතිය වෙනුවෙන් නාවිකයන් යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නාවිකයින් 17 දෙනෙකු යොදවා තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් ආරම්භකර තිබූ ව්‍යාපෘතියේ කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමත මාස 06 ක කාල සීමාව තුළ පුහුණු නාවික මිනිස් දින 1505 ක් ද, සුපරීක්ෂක නාවික මිනිස් දින 109 ක් ද, යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් දළ වැටුප් වියදම රු.4,842,000 ක් වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය සඳහා අතිරේක මාස 28 ක කාල පරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සුපරීක්ෂක නාවික මිනිස් දින 639 ක්, පුහුණු නාවික මිනිස් දින 9201 ක් හා නාවික ඉංජිනේරු කාර්මික මිනිස් දින 61 ක් යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් ගණනය කල දළ වැටුප් වියදම රු. 23,486,800 ක් වී තිබුණි. ඒ අනුව පෞද්ගලික ආයතන වල ඉදිකිරීම් වෙනුවෙන් මිනිස් දින 11,515 ක් සඳහා දළ වැටුප් වියදම ලෙස රු. 28,328,800 ක් දරා තිබුණ ද, එය ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා නාවික හමුදාව "නිල් සයුරෙන් වට හරිත දේශයක් උදෙසා" යන්න තේමා කරගත් සමාජ වගකීම් ඉටු කිරීමේ මෙහෙවරක නියැලී ඇතත් පෞද්ගලික ආයතන ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් සඳහා නාවිකයින් යෙදවීම එම මෙහෙවරට අදාල නොවන කාර්යයන් බව නීරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

විගණන පරීක්ෂණ දිනට නාවික හමුදාව සතුව විවිධ මාදිලිවලට අයත් මෝටර් වාහන 3415 කින් යුත් ප්‍රවාහන ඇණියක් පැවති අතර ඉන් නාවික හමුදාවේ කාර්යයන් වෙනුවෙන් වාහන 3231 ක් යොදාගෙන තිබුණි. වාහන 03 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර වාහන 172 ක් අලුත්වැඩියා සඳහා භාර දී තිබුණි. ඉතිරි වාහන 09 ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වෙනුවෙන් යොදවා තිබුණි.

3.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ගබඩා අත්තිකාරම් ගිණුමේ (පුපුරණ ද්‍රව්‍ය) 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය මඟින් අනාවරණය කර තිබූ රු.8,314,236 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාගම වැලිසර නාවික කඳවුරෙහි තොරතුරු තාක්ෂණවේදය සම්බන්ධයෙන් නිපුණතාවය සහිත නිලධාරීන් සිටියද ගිනි අවි සහ පතොරම් මිලදී ගැනීම් ඒකකයේ තොග සම්බන්ධයෙන් පද්ධති ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නාවික හමුදා මූලස්ථානයේ වාහන ඇතුල්වීම් හා පිටවීම් අවස්ථාවල දී රියදුරු සහායක හඳුනාගැනීම සඳහා පිවිසුම් මාර්ග අසල පරිගණක දත්ත පද්ධතිය සවිකර තිබුණි. නමුත් සියළුම රියදුරු සහායකයන් විසින් එම පරිගණක පද්ධතිය හා ක්‍රියාත්මක වන හැඳුනුම්පත් සකස් කර ගෙන නොතිබීමෙන් පරිඝණක පද්ධතිය මඟින් සියළුම රියදුරු සහායකයින් හඳුනාගැනීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) නාවික හමුදා මූලස්ථානයේ ඉදිරිපස හා පිටුපස වාහන පිවිසුම් මාර්ගවල වාහන පැමිණීමේ හා පිටවීමේ නියැදියක් අහඹු ලෙස පරීක්ෂා කල අතර එසේ පරීක්ෂා කල දිනය තුල වාහන පිවිසුම් මාර්ග වල ලේඛනයන්හි රියදුරු සහායකගේ නම ලෙස "නිලධාරී" යන්නෙන් සඳහන් කල අවස්ථා ගණන 143 ක් වීමෙන් නිලධාරීන් විසින් නිතර රියදුරු ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

සේවා වර්ගීකරණය		අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
සේවක වර්ගය	සේවා මට්ටම			
නාවික හමුදා	ජ්‍යෙෂ්ඨ	3683	3197	486
පුද්ගලයින්	තෘතියික	51317	44444	6873
එකතුව		55000	47641	7359
නාවික	ජ්‍යෙෂ්ඨ	10	6	4
හමුදා සිවිල්	තෘතියික	13	2	11
සේවක	ද්විතියික	145	73	72
පුද්ගලයින්	ප්‍රාථමික	1768	1288	480
එකතුව		1936	1369	567
මුළු එකතුව		56936	49010	7926

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛයේ අංක 01/2020 අනුව දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම්දෙනතුරු අත්හිටුවා ඇති බැවින් සිවිල් කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණි.

(ආ) ද්විතීක හා තෘතීක මට්ටමේ තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි.

ජේ.එස්.ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට